26 වන පිටෙන්

## හද රිදවන මතක සුවඳ

වන්නට ඇතැයිද මම නැවත නැවතත් චිත්ත රූප මවා ගතිමි. සැබැවින්ම මැව්වා නොව මැවුණෝ ය.

විමලේගේ බිරිඳ ප්‍රංශයට ආ ගමන සිය දරුවා දැකබලා ගැනීමට ආ ගමනක් වියහැකි වුවද එහි ඊටත් වඩා දුරගිය ප්‍රාර්ථනාවක් රැඳී තිබිණියයි යන අදහස මට මැඩගත නොහැක්කක් විය. විමලේ සමඟ ඒ පිළිබඳව කථාකළ යුතු යැයි මා තීරණය කළේ දෙගිඩියාවකින් තොරව ය.

-විමලේ, ගැහැනු, මිනිස්සු අතින් වැරදි සිද්ධ වෙනවා. ඔහෙට බැරිද පසුගිය දේවල් සේරම අමතක කරලා නෝනත් එකක් එකතු වෙලා අලුත් ජීවිතයක් පටන් ගන්න. ඒක ඔයාටයි, පුතාටයි දෙන්නටම හොඳට හිටීවි."

මගේ යෝජනාව ඇසූ විමලේ මිනිත්තුවක් තරම හඬ නගමින් සිනාසුණ හැටි මට මේ මොහොතේදීම පවා මැවී පෙනෙයි.

-අයි, අයියෝ, ඒක මම දැන් මේ ගෙවන ජිවිතේටත් කණකොකා අඬන වැඩක්. එක පාරක් පිටගිය ගෑනි ආයෙ පාරක් යනවමම තමයි සහෝදරයා. එහෙම උනොත් මට ප්‍රංශෙත් දාලා දුවන්නයි වෙන්නේ. අනික මගේ මේ උරහිසේ අමාරුවත් එක්ක ගෑනු නඩත්තු කරනවා තියා දැන් කරන රස්සාවත් කරගෙන ඉන්න පුළුවන් වෙයිද දන්නේ නෑ."

ඉන් පසුව මට ආරංචි වුයේ විමලේගේ බිරිඳ නැවත ලංකාවට ගිය බව ය. පැරිස් 17 ප්‍රදේශයේ පදිංචිව සිටි මා පදිංචිය වෙනස්කර පැරිසිය මායිමේ ඇති ප්‍රංශයේ 93 වැනි දෙපාර්තමේන්තුවේ පදිංචියට ගියෙමි. එය පැරිසියේ සි ටමහ දුරක් නොවුනත් ඉන්පසු මට විමගේ හමුවුයේ ඉඳහිට ය.

ලන්ඩනයේ රැකියාවක් කරනු සඳහා විමලේ එහි ගිය පුවත අසා මම සන්තෝෂ වීමි. ප්‍රංශයේ සිටිනවිට ඔහුට බලපෑ විවිධ ප්‍රශ්න අතර භාෂා ප්‍රශ්නය ද ප්‍රධාන විය. ලන්ඩනයේදී ඔහු එම පීඩාවෙන් තරමක් හෝ මිදෙයි. මේ වනවිට විමලේගේ පුත්‍රයාට සම්පූර්ණ රැකවරණය ලැබුණේ ඔහුගේ කල්‍යාණ මිත්‍රයාගෙන් හා ඔහුගේ බිරිඳගෙනි. එබැවින් හිතේ බරකින් තොරව විමලේට ලන්ඩනයට යාමේ හැකියාවක් තිබිණ.

දරුණු මානසික පීඩාවලින් දිගින් දිගටම බැටකන මිනිහෙකුට ශාරීරිකවත් වේදනා පැමිණවීමට දෛවය අකාරුණික වන අවස්ථා ඒමට තිබේ. එවන් එක් ගොදුරක් විමලේ වීම කොතරම් සෝචනීය ද?

රැකියාවක් සොයා ලන්ඩනයට ගිය විමලේ නැවත ප්‍රංශයට ආවේ මරණයට දින නියම වු මිනිහෙකු වශයෙනි. පිළිකාව කොහොමත් මාරාන්තික ය. එහෙත් ඔහුට වැළදී තිබුණේ ඉක්මනින් ව්‍යාප්තව යන අතිශයින් මාරාන්තික වර්ගයේ පිළිකාවකි. ලන්ඩනයේ රෝහලක සති ගණනාවක් සිටි විමලේගේ දුක සැප සොයා බැලීමට ලන්ඩන් ශාඛාවේ හිටපු සොයුරන් කටයුතු කොට තිබුණි.

ප්‍රංශයට ගෙන එන ලද විමලේ ඇතුළත් කර තිබුණේ පැරිසියේ -නෙකේ" රෝහලට ය. නෙකේ රෝහල පැරිසියේ ඇති හොඳම ළමා රෝහලක් වුවත් එහි පිළිකා රෝගීන්ට වෙන් වු අංශයක් ද තිබේ. මා විමලේ බලන්නට ගියේ ඔහු ජිවත් වෙන්නේ තව දින කිහිපයක් බව දැන දැනම ය.

පැය ගණනක් ඇතුළත විමලේගේ බඩේ ලීටර් ගණනක් වතුර පිරේ. එවිට එම වතුර අස්කළ යුතු ය. ඔහුගේ කලවා හා බත්කෙන්ඩා ඉදිමී, පුපුරා, පැලී ජලය මෙන් ඕජස පිටවෙයි. ඔහුගේ පිළිකාවේ ස්වභාවය වුයේ එයයි.

එහෙත් මේ අපුරු මිනිහා හිස මතම ඇති මරණය ගැන වගේ වගක් නැතිව මෙන් ඉතා සැහැල්ලුවෙන් සිනාසෙමින් උන්නේ ය. ඔහු බලන්නට පැමිණි යාළු මිත්‍රයන් සමඟ පෙරදී මෙන්ම සිනාසෙමින් කථාබහ කෙළේ ය. මුත්‍ර කිරීම සඳහා වැසිකිළියට යාමට ඇඳෙන් බිමට බැස්ස විමලේ ඔහුගේ සේලයින් බෝතලය එල්ලා තිබු රෝද සහිත කණුව තල්ලු කරගෙන යද්දී මම එයට උදව්වීමට තැත් කළෙමි.

-එපා, එපා, සහෝදරයා මට පුළුවන්" ඔහු සිනාසී පැවසී ය.

බොහෝ කලකට පසු මා ඩේවිඩ්සන් දුටුවේ එදින ය. මට මැනේජර් සහෝදඑයා සිහිපත් වුයේ නිරායාසයෙනි. ඔහු මිය යන්නට දින කිහිපයකට කලින් මා මේ ලෙසම ඔහු දකින්නට ගියා නොවේද? අපට සම්පූර්ණයෙන්ම ආගන්තුක වු ලෝකයකට ගෙන ආ තම පුත්‍රයා මේ විසල් නුහුරු රටේ තනිකර දමා තමාට මියයන්නට සිදු වී තිබීම විමලේගේ හිතට කොතරම් දරුණු වේදනාවක් ඇතිකරනු ඇත්දැයි මට සිතෙන්නට විය. පියෙකු වශයෙන් එම වේදනාව මගේ හිතට ද දැනුණේ ය. එම වේදනාව මඳක් හෝ සමනය වුයේ පුෂ්පේගේ මෙම වදන්වලිනි.

-විමලේ මැරෙනවයි කියලා දොස්තර නියම කරපු දින දැනටමත් පැනලා. ඒ ගොල්ලන්ට හරිම පුදුමයි. මේ මනුස්සයා කොහොමද මේ තරම් ධෛර්යයකින් මරණයට මුහුණ දෙන්නේ කියලා. ඒ ගොල්ලා දැන් වෙනම පරීක්ෂණයක් කරනවා මේ ධෛර්යය, ශක්තිය අවේ මොන බලවේගයක් නිසාද කියලා හොයා ගන්න. දැනට සති දෙකකට කලින් භාරකාර පියා වශයෙන් දරුවගේ අයිතිය විමලේ නීත්‍යානුකූලවම මට පැවරුවා. දරුවාගේ ඇපකාර පියා වශයෙන් එයාගේ මුළු අනාගතයේම වගකීම මම භාර ගත්තා. නැත්තම් ළමයා ආපහු අම්ම ළඟට යවන්න වෙනවා. -සිය මිත්‍රයාගේ දරුවාට පියෙකු වු මේ අසාමාන්‍ය මිනිසා එසේ කියන විට, මා ඔහු දෙස බලා සිටියේ යම් බැතිබර හැඟීමක් මුසු වු සෙනෙහසකිනි. ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛක පියෝදර් දොස්තයෙවුස්කිගේ සම්මානනීය කෘතියක් වු 'අපරාධ සහ දඬුවමේ' කථානායකයා වු 'රැස්කොල් නිකව්' 'සෝන්‍යා' නම් වු ගණිකාව අබියස දණ ගසා පවසා සිටියේ -මා මේ නමස්කාර කරන්නේ ඔබට නොව ඔබ තුළ දුක් විඳින්නා වු මනුෂ්‍යත්වයට" කියා නොවේද ? පුෂ්පයක් සේ සුවඳ දෙන මිනිස්කමක් ඇති එම නමින්ම යුතු මේ මිනිසාගේ මනුෂ්‍යත්වය ද එසේ පිදුම් ලැබිය යුතු තරම් උසස් නොවේද?

මා විමලේ වෙතින් නික්ම ආවේ මගේ බිරිඳ ද සමඟ නැවත ඔහු බලන්නට ඒමේ අදිටනිණි. එහෙත් එයට අවස්ථාවක් නොදීම විමලේ නික්ම ගියේ ය.

කුලතුංග (කුලෝ) මිහිදන් කළ 'පේර්ලා ෆේස්' සුසාන භූමියේදීම විමලේගේ අවසන් කටයුතු සිදුවිය. ඔහුට අවසන් ගෞරව දැක්වීමට පැමිණ සිටි පිරිස විශාල විය. අදාහනය කරන ලද විමලේගේ සිරුරේ භෂ්මාවශේෂ එම සොහොන් භූමියේම භෂ්මාවශේෂ තැන්පත් කරන භූගත සොහොන් ගැබ් තුළ තැන්පත් කරන තුරුම මමත් බිරිඳත් රැඳී සිටියෙමු.

විමලේගේ අවසන් ගෞරව දැක්වීමට පැමිණ සිටි විශාල පිරිස අතර එක් විශේෂිත කණ්ඩායමක් නොසිටීම ගැන බොහෝ දෙනෙකු චෝදනා මුඛයෙන් කථාබස් කළහ. ජ. වි. පෙරමුණේ සංවිධායක හා පිරිස එම කණ්ඩායමයි.


warna LEGAL
Justice for all...

Family Law
Business Law & Commercial Law
Conveyancing
Migration Law
Powers of Attorney & Wills
Australian/Sri Lankan Legal Advises

FIRST CONSULTATION FREE

Madhu Warnakulasuriya LL.B.
Barrister & Solicitor
29 Tristania Street, Doveton VIC 3177
Tel: 03 9713 1118 Fax: 03 9713 1118
Skype: warnalegal
Email: warnalegal@gmail.com



MARN: 1068979
Call 0432 480133

A1 Smart Painting Services

Interior/Exterior

Competitive Price
Free Quotes
Top quality work guaranteed

Contact - Steve 0421192477

Looking for accommodation in Sri Lanka



Staying at Ethara residencies is similar to having your own little holiday home in the heart of Rajagiriya, Colombo. Tucked in amongst nature away from the busy City, you'll have peace, privacy and space. Ethara residency is found in our own three story house where you have the whole top floor to yourself. For US $75 per night you will have:

- A highly secure holiday home for families with children or a group of friends under the care of our resident manager.
- 3 large bedrooms - 4 to 5 people can sleep, two bathrooms with hot water, Tea/coffee making facility, veranda, large balcony with nice view and lots of natural air and light.
- Gas Stations, Banks, Post Office, Cargils and Keells super markets, KFC, Pizza Hut, McDonald's, Perera & Sons, Barista and many other restaurants within easy access.
- 2 TVs and a selection of English novels for your entertainment.

Please email dates of your stay to
ethararesidencies@hotmail.com
to book this great family holiday home.

For more details contact
Shiroma on +9411 286 9518, +9477 220 2100 or
Call Uditha in Australia on +61422 672 484